# PAFFREL

නිදහස් හා සාධාරණ මැතිවරණයන් සඳහා ජනතා ක්‍රියාකාරීත්වය.

சுதந்திரமானதும் நியாயமானதுமான தேர்தல்களுக்கான மக்கள் செயற்பாடு.

PEOPLE'S ACTION FOR FREE & FAIR ELECTIONS


2018.07.23

පොලිස්පති තුමා,
පොලිස් මූලස්ථානය,
කොළඹ 01.

ගරු පොලිස්පති තුමනි,

<u>අපරාධකාරී චර්යාවන් සහිත පිරිස් මහජන නියෝජිතයින්ගේ ආරක්ෂකයින් ලෙස කටයුතු කිරීම.</u>

පසුගිය දශක කිහිපයක සිට සහ ඉන් ඔබ්බටත්, පාතාල ක්‍රියාකාරිකයින්, අපරාධකාරී චර්යාවන් සහිත පුද්ගලයින් දේශපාලනයට පැමිණීමත්, සමහර දේශපාලනඥයින් ඔවුන් සමග සහයෝගීව ක්‍රියාකිරීමත්, එවැනි පිරිස් තමන්ගේ සමීපතම ආධාරකරුවන් ලෙස යොදා ගැනීම පිළිබඳවත් වරින්වර සමාජයේ කතිකාවන් මතුවිය.

මේ වන විට තිරසර සංවර්ධන, වනජීවී සහ ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යවරයාගේ ආරක්ෂකයින් ද, අපරාධකාරී චර්යාවන්වලට සම්බන්ධ පුද්ගලයින් බවට විශාල චෝදනාවක් එල්ල වී ඇත. මෙය මහජන නියෝජිතයන්ගේ ගෞරවයටත්, ප්‍රජාතන්ත්‍රවාදයේ මූලික ගුණාංගවලටත් බරපතල පහරකි. එමෙන්ම එය ජනතාව සහ දේශපාලනඥයා අතර පැවැතිය යුතු විශ්වාසය සහ අවබෝධය ද පලුදු කරන්නකි. මේ වන විට ඉහත කරුණු පිළිබඳව ව්‍යවස්ථාදායකය තුළත්, ඉන් පිටතත් විවිධ අදහස් පළවී ඇත. එහෙත් මෙම තත්ත්වය පළමු වතාවට ඇතුවූවක් ද නොවන නමුදු මෑත කාලය තුළ මෙය බරපතල ලෙස සමාජ කතිකාවතක් වී ඇත.

එමෙන්ම අදාළ තොරතුරු නිවැරදි නම් එම තොරතුර හෙළිකළ මාධ්‍ය වේදීන්ට ද තර්ජනයක් විය හැකි අතර මහජන නියෝජිතයන් කෙරෙහි ජනතාව තුළ පවතින විශ්වාසය ද බිඳ වැටෙනු ඇත. එම තොරතුරු අසත්‍ය නම් එය අදාළ මහජන නියෝජිතයන්ට කරනු ලබන අපහාසයක් ද වනු ඇත.

එබැවින් අදාළ අමාත්‍යවරයාගේ නිල ආරක්ෂකයින් එවැනි අපරාධකාරී චෝදනා ලබා තිබෙන අයද යන්න පිළිබඳව විමසා බලන ලෙසත්, එමෙන්ම අනෙකුත් පක්ෂ, විපක්ෂ දේශපාලනඥයන්ගේ ද ආරක්ෂකයින් පිළිබඳව ද සොයා බැලීම සඳහා වැඩපිළිවෙලක් සකසන ලෙසත්, කාරුණිකව ඉල්ලා සිටිමි.

මෙය හුදෙක්ම මහජන නියෝජිතයින්ගේ ගෞරවය ආරක්ෂා කර ගැනීමට මෙන්ම, මහජන නියෝජිතයන් කෙරෙහි ජනතාව තබා ඇති විශ්වාසය පවත්වා ගැනීම සඳහාත්, අපරාධකාරී චර්යාවන් සහිත පුද්ගලයින් දේශපාලන බලය සමාජ විරෝධී ක්‍රියා සඳහා පාවිච්චි කිරීම වළක්වා ගැනීම සඳහා කරනු ලබන ඉල්ලීමක් බවද කාරුණිකව දන්වමි.

ස්තුතියි.
මෙයට විශ්වාසී,

රෝහණ හෙට්ටිආරච්චි,
විධායක අධ්‍යක්ෂ.


# 12/3, Robert Terrace, Robert Gunawardana Mawatha, Colombo 06, Sri Lanka.
Tel: (+94) 11 2514441 / 11 2514442 Fax: (+94) 11 2514443
E-Mail: paffrel@sltnet.lk Website: www.paffrel.lk